# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2118/9 - 2019 අප්‍රේල් මස 08 වැනි සඳුදා - 2019.04.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**වන සංරක්ෂණ ආඥාපනත**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනයේ 51 වන වගන්තිය සමග කියවිය යුතු 1979 අංක 56, 1982 අංක 13, 1988 අංක 84, 1995 අංක 23 හා 2009 අංක 65 දරන පනත් වලින් සංශෝධිත 1966 අංක 13 දරන (451 වැනි අධිකාරය වූ) වන සංරක්ෂණ ආඥාපනතේ 64(1) වගන්තිය සමඟ කියවිය යුතු 3අ. වගන්තිය යටතේ වූ නියමය.

නියමය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනයේ 51 වන වගන්තිය සමග කියවිය යුතු 1979 අංක 56, 1982 අංක 13, 1988 අංක 84, 1995 අංක 23 හා 2009 අංක 65 දරන පනත් වලින් සංශෝධිත 1966 අංක 13 දරන (451 වැනි අධිකාරය වූ) වන සංරක්ෂණ ආඥාපනතේ 3අ. වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ජනාධිපති, මෛත්‍රීපාල සිරිසේන වන මම, පහත උපලේඛනයේ මායිම් තුළ පිහිටි හෙක්ටයාර් 122.499ක් වූ විශාලත්වයෙන් යුතු වැලිහිඳ වනාන්තරය වර්ෂ 2019 ක් වූ මාර්තු මස 18 වන දින සිට වැලිහිඳ සංරක්ෂිත වනාන්තරය ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරමි.

**මෛත්‍රීපාල සිරිසේන,**
ජනාධිපති.

2019 මාර්තු මස 18 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, ඕපනායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට, ගැනෙන හෙලපල්ලපත්තු මැද කෝරළයේ සුළු කොට්ඨාශය තුළ පිහිටි වැලිහිඳ වනාන්තරයට අයත් මාදොළ ගමෙහි අවසාන ගම් පිඹුරු අංක 203 ට අයත් වූ කැබලි අංක 1727, 1746, 1743, 1744, 1781, 1782, 1778, 1784, 1787 (1777 හැර)ද, ඉහතින් දැක්වූ පළාතේ දිස්ත්‍රික්කයෙහි එකී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට

හා සුළු කොටසට අයත් වූ, ආදාදොළ ගමේ පිහිටි අවසාන ගම් පිඹුරු අංක 259 ට අයත් වූ කැබලි අංක 132 ද, එකී සුළු කොට්ඨාශයේ ගල්ලින්න ගමෙහි පිහිටි අවසාන ගම් පිඹුරු අංක 261ට අයත් වූ කැබලි අංක 172, 174, 176 යන බිම් කොටස් ඇතුළත් වන පරිදි පහත සඳහන් මායිම් තුළ පිහිටි හෙක්ටයාර් 122.499ක විශාලත්වයෙන් යුතු රජයේ ඉඩම් ප්‍රදේශය වේ.

උතුරට : අ.ග.පි. 203 හි කැබලි අංක 1749, 998, 527 (වලවෙවත්තේ දොළ) 910, 1743, 916, 921, 922, 1733, 931, 1726, 980, 981, 985, 984, 397 (රඹුක්කැටිය දෙළ), අ.ග.පි. 259ට අයත් වූ කැබලි අංක 43 (වේ ගඟ), 45 (ඇල), 44, 42 දරන රඹුක්කැටිය ඇල ද;

නැගෙනහිරට : අ.ග.පි. 259 ආදාදොළ ගමෙහි කැබලි අංක 42 (රඹුක්කැටිය ඇළ), 134, 71, 135, 48, 49, 137, 397 (රඹුක්කැටිය දෙළ), කැබලි අංක 171. 1 1/2 (ගංඉමේ දෙළ), අ.ග.පි. 261 ට අයත් වූ කැබලි අංක 2, 175 ද, අ.ග.සි. අංක 203ට අයත් වූ කැබලි අංක 557, 1770, 558 (ගංඉමේ ආර), අ.ග.පි. 203 මාදෙළ ගමේ කැබලි අංක 1030 ද;

දකුණට : අ.ග.පි. 203 මාදොළ ගමෙහි කැබලි අංක 1030, 1027, 1026, 1782, 1029, 1783 (පාර), 562 (අරඹේ ඔය), 555, 1786 (පාර), 1023, 563 (ලීල්වලේ ඇල), 1785, 1023, 1775, 1020, 1772, (වීදියේලන ඇළ) ද;

බටහිරට : අ.ග.පි. 203 මාදොළ ගමෙහි කැබලි අංක 555 (වීදියේලන ඇළ) 554, 1767, 1765, 553, 1018, 1864, 551, 1013, 1247, 1248, 1755, 1754, 1245, 1243, 1244, 529 (ගංඉමේ දොළ), 1749 ද වේ.

ප්‍රමාණය (හෙක්.) : 122.499

04 - 728

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.